**ගලිගමුව ප්‍රාදේශීය සභාව**
**කෑගල්ල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 පෙබරවාරි 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 20 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ගලිගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී පුස්තකාල පොත් මිළදීගැනීම වෙනුවෙන් දරන ලද රු. 124,800 ක් ගිණුම්ගත නොකිරීම නිසා වර්ෂයේ ප්‍රාග්ධන වියදම හා පුස්තකාල පොත් සහ ප්‍රාග්ධනයෙන් ආදායමට දායක වීමේ ගිණුම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පරිත්‍යාග වශයෙන් සභාවට ලැබී තිබූ රු. 535,000 ක් වටිනා ජල බවුසරය ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ඉඩම් කට්ටිකර අළෙවි කිරීමේදී පොදු කටයුතු සඳහා සභාවට පවරා තිබුණු අක්කර 15 රූඩ් 02 ක ඉඩම් කට්ටි 08 ක් ස්ථාවර වත්කම් ලේඛනයට හා ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ණයගැතියෝ සහ කර්මාන්ත ණයහිමියෝ පිළිවෙලින් රු. 1,551,990 ක් හා රු. 762,085 ක් මූල්‍ය ප්‍රකාශන වල අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) ලැබිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 කට වඩා පැරණි අයවිය යුතු ශේෂය රු.14,701,065 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු. 16,608,314 ක් විය.

## 1.4 අනුකූල නොවීම්

--------------------

### 1.4.1 නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

---------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම රු | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත 158(1) වගන්තිය | 361,492 | වරිපනම් බද්දක් හෝ අක්කර බද්දක් නොගෙවීම සම්බන්ධයෙන් වූ විට එම බද්ද අයවීමට ඇති ස්ථානයේ අයිතිකරුගේ දේපල තහනමට ගෙන විකිණීම හෝ මුදල් අයකර ගැනීම කලයුතු වුවත් දීර්ඝ කාලයක සිට බදු අය නොවී පැවති දේපල සම්බන්ධයෙන් බදු අයකර ගැනීමට 2017 දෙසැම්බර් 31 දින වනවිටත් නීතිමය පියවර ගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික වාදී ජනරජයේ මුදල් ාසි සංග්‍රහය මු.රෙ. 1646 | | සභාවේ වාහන 15 ක 2015 සැප්තැම්බර් සිට 2018 මැයි දක්වා කාලපරිච්ඡේදයට අදාල ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 7,372,191 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 8,995,783 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,855,000 | 1,712,974 | 1,426,656 | 347,243 | 2,377,000 | 2,428,824 | 1,811,284 | 617,540 |
| කුලී | 4,483,775 | 2,317,060 | 2,211,110 | 105,950 | 3,488,500 | 259,430 | 259,430 | - |
| බලපත්‍ර ගාස්තු | 880,200 | 897,233 | 897,233 | - | 836,200 | 459,200 | 459,200 | - |
| වෙනත් ආදායම් | 14,556,000 | 15,502,332 | 6,226,038 | 9,276,294 | 15,492,000 | 64,075 | 64,075 | - |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, කුලී ආදායම් හා වෙනත් ආදායම් පිළිවෙලින් සියයට 23, 51 හා 57 කින් අඩුවී තිබු අතර බලපත්‍ර ගාස්තු ආදායම සියයට 2 කින් වැඩි වී තිබුණි.

### 2.2.3 බලපත්‍ර ගාස්තු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පාරිසරික බලපත්‍ර

2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත් මඟින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත 1533 / 16 හා 2008 ජනවාරි 25 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගත යුතු සහා බලප්‍රදේශය තුල පැවති ව්‍යාපාර ආයතන 78 ක් සඳහා 2017 නොවැම්බර් වන විටත් පාරිසරික බලපත්‍ර නිකුත්කර නොතිබුණි. බලපත්‍ර ලබා නොගත් ආයතන පරිසර අධිකාරියේ කොන්දේසි වලට අනුකූලව ව්‍යාපාර පවත්වනවාද යන්න තහවුරු නොවූ අතර සභාවට ලැබිය යුතු රු. 312,000 ක ආදායමක්ද අහිමි වී තිබුණි.

(ආ) වෙළඳ බලපත්‍ර

සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපාර ස්ථාන 04 කින් අයවියුතු රු. 5,280 ක බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 150 (4) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.4 වෙනත් ආදායම්**

---------------------

විකුණන ලද ඉඩම් වල විකුණුම් වටිනාකමින් සියයට එකක බදු මුදලක් සභාවට අයකර ගත යුතු වුවත් විකුණූ ඉඩම් 03 කින් තක්සේරු වටිනාකම මත බදු මුදල් අයකර තිබූ අතර ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයෙන් විස්තර ලබා ගෙන නියමිත බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1 කාර්යසාධනය**

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි වනවිටත් සකස් කර නොතිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------------

සභා බල ප්‍රදේශයේ මළ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සුදුසු ස්ථානයක් නොමැති බැවින් ගලි බවුසරය සේවයේ යොදවා නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

සමාලෝචිත වර්ෂය තුල අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 107 ක් අනුමත කර නොතිබූ අතර ගොඩනැගිලි සැලසුම් අනුමත කරගත් ස්ථානවල ඉදිකිරීම් සිදුකර තිබේද යන්න හා නොමැති නම් බලපත්‍ර කාලය දීර්ඝ කර ගෙන තිබේද යන්න තහවුරු කරගෙන නොතිබුණි. ඊට අමතරව අළුතින් ඉදිකර තිබුණු ගොඩනැගිලි සඳහා අනුකූලතා සහතික ලබාගෙන තිබේද යන්න පසු විපරම් කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

අනුමත කාර්යමණ්ඩල අනුව 2017 නොවැම්බර් 22 දිනට පැවති පුරප්පාඩු 06 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

----------------------------------------------

2013 ජූනි සිට ධාවනයෙන් ඉවත්කර තිබූ ට්‍රැක්ටරයක් අළුත් වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට ක්‍රියාමාර්ග නොගෙන දිරාපත්වෙමින් පැවතිණි.

(ආ) පවරා නොගත් වත්කම්

----------------------------

ලියාපදිංචි අයිතිය වෙනත් ආයතන සතු එහෙත් සභාවේ පරිහරණයට යොදාගෙන ඇති වාහන 13 ක් විය.

**3.5 ප්‍රසම්පාදනය**

-----------------

**වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4 ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය**

-------------------------------------------

**4.1 අයවැය පාලනය**

--------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන සලසා තිබුණු වැය විෂයයන් 24 ක එකතුව වූ රු. 4,769,000 ක ප්‍රතිපාදන සියයට 100 ක් හා වැය විෂයයන් 18 ක එකතුව වූ රු.4,995,000 ක ප්‍රතිපාදන වලින් සියයට 50 ත් 99 ත් අතර ප්‍රමාණයක් වූ එකතුව රු. 9,764,000 ක් උපයෝජනය කර නොතිබුණි.

**5 පද්ධති හා පාලන**

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | වත්කම් කළමනාකරණය | (i) | ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත නොකිරීම |
| | | (ii) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම |
| (ආ) | අභ්‍යන්තර පාලනය | | ප්‍රමාණවත් විගණනයක් සිදු නොකිරීම |
| (ඇ) | ණයගැති/ ණයහිමි පාලනය | | අයි / ඌන වෙන්කිරීම් අවම වන ආකාරයට කටයුතු නොකිරීම |

(ඇ) ආදායම් පරිපාලනය

(i) හිග වරිපනම් බදු අයකිරීමට නීත්‍යානුකූලව කටයුතු නොකිරීම
වරිපනම් බදු තක්සේරුව යාවත්කාලීන නොකිරීම
(ii) අක්කර බදු අයකරනු ලබන ප්‍රදේශ පිළිබඳ සමීක්ෂණයක් සිදු නොකිරීම
(iii) කඩ කාමර සඳහා නව තක්සේරුවක් 2015 වර්ෂයේ සිට
(iv) සිදු නොකිරීම
සමීක්ෂණ වාර්තා අනුව ආදායම් ලේඛන යාවත්කාලීන
(v) නොකිරීම